මානව සම්පත් අභිවර්ධන ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය ශ්‍රී ලංකාව
වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම්

2010

மனிதவள மேம்பாட்டு நிறுவனம்
கொழும்புப் பல்கலைக்கழகம், ஸ்ரீலங்கா
ஆண்டறிக்கை மற்றும் வருடாந்த கணக்குகள்

2010

INSTITITUE OF HUMAN RESOURCE ADVANCEMENT
UNIVERSITY OF COLOMBO, SRI LANKA
ANNUAL REPORT AND ANNUAL ACCOUNTS

2010

IHRA
UNIVERSITY OF COLOMBO

පටුන

		පිටු අංකය
1	2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව	01 - 14
2	2010 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය	15
3	2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම	16
4	විගණකාධිපති වාර්තාව	17 - 22
5	2013 වර්ෂයට අදාල විගණන වාර්තාව පිළිබඳ ආයතනයේ අදහස්	23 - 31

பொருளடக்கம்

		பக்கம்
1.	2010 ஆம் ஆண்டிற்கான ஆண்டறிக்கை	32 - 44
2.	2010 டிசெம்பர் 31ஆந் திகதியில் ஐந்தொகை	45
3.	2010 டிசெம்பர் 31ஆந் திகதியில் முடிவடைந்த ஆண்டிற்கான செலவினக் கணக்குகள்	46
4.	பொதுக் கணக்குப்பரிசோதகர் அறிக்கை	47 - 54
5.	2013 ம் ஆண்டுக்கான கணக்காய்வு சம்பந்தமான கருத்ததுக்கள்	55 - 65

Contents

		Page No.
1	Annual Report for the year 2010	66 - 79
2	Balance Sheet as at 31st December, 2010	80
3	Income and Expenditure Account for the year Ended 31st December, 2010	81
4	Auditor General's Report	82 - 89
5	Comments of the IHRA on the Auditor Genaral's Report on the Accounts of the IHRA	90 - 95

මානව සම්පත් අභිවර්ධන ආයතනය (IHRA-UOC)
කොළඹ විශ්වවිද්‍යාලය

වාර්ෂික වාර්තාව 2010

1. හැඳින්වීම

2006 අංක 01 දරන නියමාවලියෙන් සංශෝධනය කරනු ලැබූ 1979 අංක 11 දරන නියමාවලිය යටතේ මානව සම්පත් අභිවර්ධන ආයතනය පිහිටුවන ලදී. "දැනුම් ආර්ථිකය" මගින් ගෝලීය සහ කලාපීය වර්ධනයන්ට අනුව මානව සම්පත් අභිවර්ධන ආයතනය (IHRA) ඉහළ මට්ටමකට වර්ධනය වෙමින් පවතියි.

ආයතනය පිහිටුවනු ලැබූ පසුගිය කාලයේ දී "දැනුමැති සේවකයින්" යන යෙදුම උපයෝගී කරගනු නොලැබුවත් සේවා නියුක්ත "සේවා කණ්ඩායම්" සඳහා අධ්‍යාපනයක් ලබා දීමේ මූලික පරමාර්ථය නොවෙනස්ව පැවතිණ. එතෙකුදු වුවත් වර්තමාන දැනුමැති සේවකයා යන කාණ්ඩයට සාම්ප්‍රදායික සේවා කණ්ඩායම් මෙන්ම කළමනාකරණ කාණ්ඩය ද ඇතුළත් වන අතර, "දැනුමැති සේවකයන්" මානව සම්පත් සම්බන්ධයෙන් ඕනෑම කාණ්ඩයක් අභිවර්ධනය කිරීමට ආයතනයේ වර්තමාන ප්‍රතිපත්ති පිළියෙළ කර ඇත.

නිවැරදි සංවර්ධන මාවත තුළ රටට මග පෙන්වීම සහ උපාධි අපේක්ෂකයන් පමණක් නොව තීරණ ගන්නන් ඇතුළත් රටේ සේවක කණ්ඩායම්වලට අධ්‍යාපනය ලබාදීමේ ද අතිමහත් වගකීම මෙම විශ්වවිද්‍යාල සහ විශ්වවිද්‍යාල ආයතන සතු වන්නේය. ලෝකයෙහි ඉතා වේගයෙන් වෙනස් වන්නා වූ දැනුමෙන් වර්තමාන සේවා කණ්ඩායම් සහ තීරණ ගන්නන් යාවත්කාලීන නොකරනු ලබන්නේ නම්, අපේක්ෂිත පරිදි රටට ඉදිරියට යාමට නොහැකි වන්නේය. සේවක අධ්‍යාපන ආයතනය (IWE) ලෙසින් ආරම්භ වූ අවස්ථාවේ දී මෙන්ම වර්තමාන මානව සම්පත් අභිවර්ධන ආයතනයේ (IHRA) මූලික සංකල්පය වන්නේ ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල පවත්නා තත්ත්වයන් රඳවා ගනිමින් සේවාවන්හි නියුක්ත වූවන්ට අධ්‍යාපනය ලබා දෙන අතර රටට සේවය කිරීමයි.

2. ඉදිරි දැක්ම

ඉදිරි-දැක්ම

අභියෝගාත්මක

ගෝලීය තත්වයනට

මුහුණ දිය හැකි

සහ

අපගේ ජාතික සංවර්ධනයේ

මිනිස් පදනම ශක්තිමත් කළ හැකි වූ පරිණත සහ බුද්ධිමත්

"දැනුම-භාවිතකරන්නන්"

ලෙසින්

මානව සම්පත

අභිවර්ධනය කිරීම සඳහා සම්පූර්ණයෙන්ම ඇපකැප වූ

ඉහළම තත්වයේ

පිළිගත් ආයතනයක්

බවට පත්වීමටය.

03. මෙහෙවර

මෙහෙවර

"උපයමින් ඉගෙනීම" කරන

සේවපය, සේවක සහ ව්‍යවසායක වූ

සේවා-කාණ්ඩ සඳහා, තම හැකියාවන් ඉහළ නැංවීමට පූර්ණ

තත්ව-කළමනාකරණ ක්‍රියාවලිය ඔස්සේ

ඉහල මට්ටමේ පරිපූර්ණ අධ්‍යාපනයක් ලබා ගැනීමට පහසුකම්

සපයමින් මග පෙන්වීම.

ඔවුන්ගේ විචාරාත්මක සහ තර්කානුකූලව

සිතීමේ හැකියාව, ආචාරධර්ම, ප්‍රමිතීන්, ව්‍යවසාය දක්ෂතා,

නායකත්ව ලක්ෂණ,

සහ

යුතුකම් හා අයිතිවාසිකම් එකිනෙක මත රඳා පවතින බව

අවබෝධ කොට ගෙන තිබීම ආදිය හොඳින් වර්ධනය කර

ගැනීමට තව දුරටත් මග පෙන්වීම.

දේශයේ දැනුම්-ආර්ථිකය

සඳහා

බලපෑමක් ඇති කළ හැකි දායකත්වයක්

දැක්වීමට ඉහළ පෙළේ මිනිස් සම්පත් සමූහයක් ලෙස

පෙළ ගැසුනු දැනුම්-සේවා-කාණ්ඩ උත්පාදනය කිරීමට කැප වීම.

04. අධ්‍යක්ෂ වාර්තාව

මා 2010 වසර සඳහා අදාළ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරනුයේ ඉමහත් ප්‍රීතියෙනි. ශ්‍රී ලංකාවේ වාණිජ හා පරිපාලන අගනගරය වන කොළඹ නගරයේ කේන්ද්‍රස්ථානයක පිහිටි මානව සම්පත් අභිවර්ධන ආයතනයේ රාජ්‍ය ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කරන ප්‍රථම උපාධි පාඨමාලාව වන තුන් අවුරුදු ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවේ සහ ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාවේ ලියාපදිංචි විද්‍යාර්ථීන් 591 ක පමණ පිරිසක් 2010 වසරේදී අධ්‍යාපනය ලැබූහ.

මානව සම්පත් අභිවර්ධන ආයතනය 2010 වසරේදී රටෙහි දැනුමැති සේවකයින්ගේ වෘත්තිය දැනුම වර්ධනය කිරීමේ අරමුණින් භූ විද්‍යා තොරතුරු පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් 41ක් බඳවා ගන්නා ලදි. මෙයට අමතරව 2010 වසර තුළ අනෙකුත් පශ්චාත් උපාධි හා ව්‍යාප්ති පාඨමාලාවන්හි සිසුන් 7000ක් පමණ අධ්‍යාපනය ලැබූහ. එමෙන්ම ආයතනය මිලියන 41කට ආසන්න මුදලක් රාජ්‍ය ප්‍රතිපාදනවලට පරිබාහිරව බාහිර පාඨමාලා මගින් උපයා ඇත.

වර්තමානයේ මානව සම්පත් අභිවර්ධන ආයතනය පිරිනමන පාඨමාලා සඳහා පවතින ඉල්ලුමට අනුරූපව ඉඩකඩ පහසුකම් වර්ධනය කිරීමට පවත්නා භූමිය ප්‍රමාණවත් නොවීම විශාල ගැටලුවක්ව පවතී. ආයතනයේ ඉඩකඩ වර්ධනය කිරීමට නව ගොඩනැගිල්ලක අවශ්‍යතාව ප්‍රබලව දැනී ඇත.

ආචාර්ය ඩබ්. කේ. හිරිඹුරේගම
අධ්‍යක්ෂ

05. 2010 වර්ෂයේ ආයතනය අත්කරගත් වර්ධනයන් සහ සංවර්ධනය පිළිබඳ සාරාංශය

5.1 *රටේ වැඩ කරන මානව සම්පතට අතිරේක වටිනාකමක් එකතු කිරීම.*

ශ්‍රම අධ්‍යාපනවේදී සේවා නියුක්ත උපාධිධාරීන් (BLE) 198 දෙනෙකු බිහි කිරීම, මානව සම්පත් අභිවර්ධන පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරීන් (PGDipHRA) 45 දෙනෙකු බිහි කිරීම, මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ අධ්‍යයන ඩිප්ලෝමාධාරීන් (සේවා නියුක්ත) 22 දෙනෙකු බිහි කිරීම, ජාත්‍යන්තර ව්‍යාපාර ඩිප්ලෝමාධාරීන් (DIB) 13 දෙනෙකු බිහි කිරීම, සෞඛ්‍ය ප්‍රවර්ධන ඩිප්ලෝමාධාරීන් 57 දෙනෙකු බිහි කිරීම, රියදුරු සහ මාර්ග ආරක්ෂණ උපදේශක සහතිකපත් දරන්නන් 20 දෙනෙකු බිහි කිරීම, පරිගණක යෙදවුම් සහතිකපත්ධාරීන් (CCCA) 50 දෙනෙකු බිහි කිරීම, ඉංග්‍රීසි භාෂා සහතිකපත් දරන්නන් 3000ක් සහ දෙමළ භාෂා සහතිකපත් දරන්නන් 816 දෙනෙකු බිහි කිරීම.

5.2 *ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි වැඩසටහන*

ශ්‍රම අධ්‍යාපනවේදී ඩිප්ලෝමාවට සහ උපාධි ප්‍රථම වර්ෂයේ වැඩසටහනට ඇතුළත් වීම සඳහා තරගකාරිත්වය වැඩිවිය. තෝරා ගැනීමේ පරීක්ෂණය 2010 සැප්තැම්බර් මස 10 වැනි දින පවත්වන ලද අතර 254 දෙනෙකු තෝරා ගන්නා ලදි.

5.3 *භූවිද්‍යා තොරතුරු පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා අංක 02 ආරම්භ කිරීම.*

භූවිද්‍යා තොරතුරු පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා අංක 02 සඳහා 41 දෙනෙක් තෝරා ගන්නා ලදි. 2010 අගෝස්තු මාසයේ දී මෙම පාඨමාලාව ආරම්භ කරන ලදි.

5.4 *සෞඛ්‍ය ප්‍රවර්ධන ඩිප්ලෝමා **(DHP)** පාඨමාලා අංක 03 ආරම්භ කිරීම.*

සෞඛ්‍ය ප්‍රවර්ධන ඩිප්ලෝමා (DHP) පාඨමාලා අංක 03, 2010 නොවැම්බර් මස ආරම්භ කරන ලදි. පාඨමාලා අංක 03 සඳහා සිසුන් 35 දෙනෙක් තෝරා ගන්නා ලදි.

5.5 *ජාත්‍යන්තර ව්‍යාපාර ඩිප්ලෝමා පාඨමාලා අංක 03 ආරම්භ කිරීම.*

සේවයෙහි නියුතු විද්‍යාර්ථීහු 28 දෙනෙක් මෙම පාඨමාලාව සඳහා තෝරා ගන්නා ලද අතර, 2010 මැයි මස ආරම්භ කරන ලදි.

5.6 *ඉංග්‍රීසි භාෂා සහතිකපත්‍ර පාඨමාලා අංක 30 ආරම්භ කිරීම.*

ඉංග්‍රීසි භාෂා සහතිකපත්‍ර පාඨමාලා අංක 30 සඳහා සිසුන් 3865 දෙනෙක් ලියාපදිංචි වූ අතර, 2010 මාර්තු මස පාඨමාලාව ආරම්භ කරන ලදි.

5.7 *රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව දෙමළ භාෂාව ඉගැන්වීමේ සහතිකපත්‍ර පාඨමාලා අංක 05 ආරම්භ කිරීම.*

දෙමළ භාෂාව ඉගැන්වීමේ සහතිකපත්‍ර පාඨමාලා අංක 05 සඳහා සිසුන් 1134 දෙනෙක් ලියාපදිංචි වූ අතර, 2010 පෙබරවාරි මස පාඨමාලාව ආරම්භ කරන ලදි.

5.8 *සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා දෙමළ භාෂාව ඉගැන්වීමේ වැඩමුළු ආරම්භ කිරීම.*

5.9 *මානව සම්පත් අභිවර්ධන ආයතනයේ නව ඉදිකිරීම්*

ප්‍රධාන ගොඩනැගිල්ල පිළිසකර කිරීම, ප්‍රධාන ගොඩනැගිල්ලේ පිහන් ගඩොල් ඇතිරීම හා පින්තාරු කිරීම, ප්‍රධාන ගොඩනැගිල්ලේ වහල පින්තාරු කිරීම, පරිගණක කාමරය වැඩි දියුණු කිරීම, බිම් මහලෙහි කාර්යාල භූමිය පුළුල් කිරීම, ආයතනය වට කර ඉදි කර ඇති තාප්පය පින්තාරු කිරීම, ආයතනයේ පළමුවෙනි මහලෙහි ඇස්බැස්ටස් වහළ ඉවත් කර කොන්ක්‍රීට් දමා ඉඩ ප්‍රමාණය වැඩි කර ගැනිම.

06. කළමනාකරණය

2006 අංක 01 දරන නියමාවලියෙන් සංශෝධනය කරනු ලැබූ 1979 අංක 11 දරන නියමාවලිය මගින් ආයතනයේ වැඩකටයුතු පාලනය වන්නේය. මානව සම්පත් අභිවර්ධන ආයතනය කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ වන අතර එහි ශාස්ත්‍රීය කමිටුවේ (Acadamic Syndicate) නිර්දේශය මත පාලක සභාවේ අනුමැතිය අනුව උපකුලපති විසින් පූර්ණකාලීන අධ්‍යක්ෂවරයෙක් පත් කරනු ලැබේ. අධ්‍යක්ෂවරයා ආයතනයේ ගිණුම් නිලධාරියා වන අතර අධ්‍යයන සහ පරිපාලන නිලධාරියා ද වන්නේය. ශාස්ත්‍රීය කමිටුව ආයතනයේ අධ්‍යයන සේවා අධිකාරිය ද වන්නේය. නියමාවලියට අනුව පත්කරනු ලබන සෙසු සාමාජිකයින්ට අතිරේකව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයින් අට දෙනෙකුගෙන් ශාස්ත්‍රීය කමිටුව සමන්විත වේ. ශාස්ත්‍රීය කමිටුවේ, විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ හා පාලක සභාවේ සහ කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව ආයතනය විසින් අධ්‍යයන මණ්ඩල කිහිපයක් ස්ථාපිත කරනු ලැබ ඇත.

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදන ආයතනයට සපයනු ලබන අතර නියමාවලියට අනුව සියලු මූල්‍ය සහ පරිපාලන කටයුතු ආයතනය විසින් මෙහෙයවනු ලබයි. නියමාවලියට අනුව ආයතනයේ අධ්‍යක්ෂවරයා පරිපාලන සහ මූල්‍ය නිලධාරියා වන අතර සියලුම අධ්‍යයන කාර්යයන්ගේ වගකීම මානව සම්පත් අභිවර්ධන ආයතනයේ ශාස්ත්‍රීය කමිටුව වෙත සහ කොළඹ විශ්වවිද්‍යාලයේ සනාථන සභාව, පාලක සභාව මත රඳා පවතී. ආයතනය තුළ සංයුක්ත පාලන භාවිතයන් සහ සංයුක්ත පාලන සංස්කෘතියක් ක්‍රමානුකූලව හඳුන්වා දෙනු ලැබ ඇත.

6.1 ශාස්ත්‍රීය කමිටුව සහ අධ්‍යයන මණ්ඩල

6.1.1 ශාස්ත්‍රීය කමිටුව

සභාපති - අධ්‍යක්ෂ මානව සම්පත් අභිවර්ධන ආයතනය		ආචාර්ය ඩබ්ලිව්. කේ. හිරිඹුරේගම (2005 දෙසැම්බර් මස සිට)
නිල බලයෙන් පත් වූ සාමාජිකයෝ		
පීඨාධිපති	ශාස්ත්‍ර පීඨය	මහාචාර්ය ඉන්ද්‍රලාල් ද සිල්වා
	අධ්‍යාපන පීඨය	මහාචාර්ය එස්. සන්දරසේගරම්
	විද්‍යා පීඨය	මහාචාර්ය ටී. ආර්. ආරියරත්න
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද සාමාජිකයෝ		
ඒ. පී. ගුණරත්න මහතා		හිටපු විදුහල්පති, ආනන්ද විද්‍යාලය, කොළඹ
එස්. විදානපතිරණ මහතා		ජේ. ස. ලේකම් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
ප්‍රේමචන්ද්‍ර ඇපා මහතා		ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ
ආර්. මාසකෝරාල මහතා		මහලේකම්/ ආසියානු නාවික කවුන්සිලය
ආර්. ඒ. යූ. රණවීර මහතා		ගණකාධිකාරී
කේ. ආර්. උඩුවාවල මහතා		නියෝජ්‍ය අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය.
කේ. ගමගේ මහතා මහතා		විධායක අධ්‍යක්ෂ, අන්තරායකර ඖෂධ පාලන ජාතික මණ්ඩලය
මහින්ද මඩිහෑව්වා මහතා		ලේකම්, කම්කරු අමාත්‍යාංශය
අධ්‍යයන මණ්ඩල නියෝජනය කරන සාමාජිකයෝ		
එම්. ජී. පී. හේමකුමාර මහතා		මානව සම්පත් අධ්‍යයන මණ්ඩලය
ආර්. එම්. ආර්. බී. රාජපක්ෂ මහතා		
කේ. ඩී. එන්. හේවගේ මහතා		ව්‍යාපෘති වැඩසටහන් අධ්‍යයන මණ්ඩලය
කේ. පී. මාතොටආරච්චි මහත්මිය		
ආචාර්ය බී. එම්. කිරිබණ්ඩා		භාෂා ඉගෙනුම් වැඩසටහන් මණ්ඩලය
බී. කේ. පී. අබේසූරිය මහත්මිය		

6.1.2 අධ්‍යයන මණ්ඩල

පහත දැක්වෙන පරිදි (සාමාන්‍යයෙන් මසකට වරක්) විමර්ශනයට භාජනය වන කාලය තුළ රැස්වීම් වාර පවත්වනු ලැබ ඇත.

(අ) මානව සම්පත් අධ්‍යාපනය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය - රැස්වීම් වාර 12 යි

(ආ) භාෂා ඉගැන්වීම් වැඩසටහන් පිළිබඳ අධ්‍යයන මණ්ඩලය - රැස්වීම් වාර 10 යි

(ඇ) ව්‍යාප්ති වැඩසටහන් පිළිබඳ අධ්‍යයන මණ්ඩලය - රැස්වීම් වාර 06 යි

6.2 අධ්‍යයන පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය

2010 වසරේදී ආයතනයේ ස්ථිර කාර්ය මණ්ඩලය 36 දෙනෙකුගෙන් සමන්විත විය. ඊට අධ්‍යයන කාර්ය මණ්ඩලයේ හතරක් (04) සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ තිස් එකක් (31) ඇතුළත් විය. එයට අමතරව, එක් (01) අධ්‍යයන සම්බන්ධීකාරකවරයෙක් (කොන්ත්‍රාත් පදනම මත), එක් (01) පරිගණක තාක්ෂණ උපදේශකවරයෙක් (තාවකාලික) හා පැවරුම් පදනම මත පත් කළ පාඨමාලා සම්බන්ධීකාරකවරු හතරක් (04) විය.

6.2.1 අධ්‍යයන කාර්ය මණ්ඩලය

නම	විෂය	මාධ්‍යය	ආචාර්ය උපාධි	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය	ආධුනික කථිකාචාර්ය	උපදේශක	අධ්‍යයන සමායෝජක
ආචාර්ය ඩබ්. කේ. හිරිඹුරේගම මහතා	පර්යේෂණ ක්‍රමවේදය	සිංහල	✓				
එම්. පී. පී. ජේමකුමාර මහතා	කළමනාකරණය හා ගිණුම්කරණය			✓			
කේ. පී මාතොටආරච්චි මහත්මිය	ආර්ථික විද්‍යාව				✓		
කේ. ඩී. එන්. හේවගේ මහතා	සංඛ්‍යානය සහ ගණිතය				✓		
ඩබ්. එස්. චන්ද්‍රසේකර මහතා	-						✓*
පී.බී.පී.ඩී. ද සිල්වා මහතා	පරිගණක තාක්ෂණය					✓*	
එකතුව			01	01	02	01	01

* පැවරුම් පදනම මත

6.2.2 පරිපාලන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලය

අංශය	ජ්‍යෙෂ්ඨතම	ජ්‍යෙෂ්ඨ	කනිෂ්ඨ	සුළු සේවක	එකතුව
පාලන අංශය	01	02	06	06	15
මුදල් අංශය	01	03	02	01	07
විභාග අංශය	01	01	02	01	05
පුස්තකාලය	01	-	01	02	04
එකතුව	**04**	**06**	**11**	**10**	**31**

7. අධ්‍යයන වැඩසටහන් සහ විද්‍යාර්ථීන් සංඛ්‍යාව

සේවා නියුක්ත විද්‍යාර්ථීන් දැනුමැති සේවකයින් වශයෙන් අභිවර්ධනය කිරීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලයීය මානව සම්පත් අභිවර්ධන ආයතනය, ප්‍රධාන ක්ෂේත්‍ර 4 ක් යටතේ අධ්‍යයන වැඩසටහන් මෙහෙයවනු ලබයි. මෙහි විවිධ ක්ෂේත්‍ර වන්නේ

(අ) උපාධි පාඨමාලාව (ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය)

(ආ) උපාධි පූර්ව ඩිප්ලෝමා වැඩසටහන් (ශ්‍රම අධ්‍යාපනවේදී ඩිප්ලෝමා වැඩසටහන සහ ඩිප්ලෝමා පාඨමාලාව) (උපයා ගත් මූල්‍ය ප්‍රතිපාදන භාවිතයෙනි)

(ඇ) පශ්චාත් උපාධි වැඩසටහන් උපයා ගත් මූල්‍ය ප්‍රතිපාදන භාවිතයෙනි

(ඈ) සහතිකපත්‍ර පාඨමාලා සහ කෙටි කාලීන වැඩමුළු සහ වෙනත් වැඩසටහන් (උපයා ගත් මූල්‍ය ප්‍රතිපාදන භාවිතයෙනි)

7.1 මූලික උපාධි පාඨමාලාව - ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය

අභ්‍යන්තරව පිරිනමනු ලබන තුන් අවුරුදු උපාධියක් වන මෙම වැඩසටහන අංශ දෙකකින් සමන්විත වේ. උපාධි පළමුවෙනි වසරට ඇතුළත් වීමට සුදුසුකම් නොමැති අයවලුන් එක් අවුරුදු ඩිප්ලෝමා පාඨමාලාවට සහ අදාළ පරීක්ෂණ සම්පූර්ණ කළ පසු උපාධි පළමු වසර සඳහා බඳවා ගනු ලැබේ. 2009 වර්ෂයේ පාඨමාලාව සම්පූර්ණ කළ සේවා නියුක්ත විද්‍යාථීන් 143 දෙනෙකුට 2010 වර්ෂයේ උපාධි ප්‍රදානෝත්සවයේ දී ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය පිරිනමනු ලැබිය.

මෙම අධ්‍යයන වැඩසටහනේ විවිධ මට්ටම් සඳහා 2010 වර්ෂයේ ලියාපදිංචිව සිටි මුළු සංඛ්‍යාව 591 කි. එහි විස්තර පහත දක්වා ඇත.

ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව - ලියාපදිංචි විද්‍යාර්ථීන් සංඛ්‍යාව - 2010

වැඩසටහන	පාඨමාලාව	මාධ්‍යය	2010 නව බඳවා ගැනීම	1 වෙනි වසර විද්‍යාර්ථීන්	2 වන වසර විද්‍යාර්ථීන්	3 වන වසර විද්‍යාර්ථීන්	එකතුව
මූලික උපාධි වැඩසටහන	ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව	සිංහල	54	54	-	-	591
	ශ්‍රම අධ්‍යාපනවේදී උපාධිය	සිංහල	201	254	153	130	

2010 අධ්‍යයන වර්ෂයේ ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා මට්ටමට සහ ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි I වෙනි කොටස සඳහා විද්‍යාර්ථීන් තෝරා ගැනීම පිණිස 2010 සැප්තැම්බර් මස 10 වන දින පැවති තෝරා ගැනීමේ පරීක්ෂණයෙන් සාර්ථකව සමත් වූ අයවලුන් සඳහා සම්මුඛ පරීක්ෂණය 2010 නොවැම්බර් 13 සහ 14 යන දිනවල පවත්වන ලදී. ඉන් පිළිවෙළින් විද්‍යාර්ථීන් 54 දෙනෙක් සහ 201 දෙනෙක් සෘජුවම ඩිප්ලෝමා පාඨමාලාව සහ ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව සඳහා තෝරා ගනු ලැබිණ. මීට අතිරේකව ඩිප්ලෝමා මට්ටමේ සිට ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි I වෙනි කොටස සඳහා විද්‍යාර්ථීන් 53 දෙනෙකු

තෝරා ගන්නා ලදී. ඒ අනුව ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි I වෙනි කොටස සමස්ථ විද්‍යාර්ථීන් සංඛ්‍යාව 254 ක් වූහ.

ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා මට්ටමේ හා ශ්‍රම අධ්‍යාපන උපාධි I, II සහ III මට්ටම් සඳහා 2010 වසරේ විභාග පවත්වා සමත්වූවන් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව - සෙමෙස්තර අවසන් පරීක්ෂණ සමත් විද්‍යාර්ථීන් සංඛ්‍යාව - 2010

පාඨමාලාව	ප්‍රථම සෙමෙස්තරය		දෙවන සෙමෙස්තරය		පැරණි නිර්දේශය
	පළමු පෙනී සිටීම	නැවත පෙනී සිටීම	පළමු පෙනී සිටීම	නැවත පෙනී සිටීම	
ශ්‍රම අධ්‍යාපන ඩිප්ලෝමා පාඨමාලාව	37	2	34	1	4
ශ්‍රම අධ්‍යාපන උපාධි I	144	17	117	40	14
ශ්‍රම අධ්‍යාපන උපාධි II	91	5	88	15	30
ශ්‍රම අධ්‍යාපන උපාධි III	128	-	128	-	70

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ මෙම උපාධි අපේක්ෂකයින් සේවා නියුක්තික විද්‍යාර්ථීන්ගෙන් සමන්විත සුවිශේෂ කණ්ඩායමකි. සේවයෙහි නියුක්තව සිටියද ඔවුන්ගේ දැනුම සහ වෘත්තිය අභිවර්ධනය පිණිස රජය මූල්‍යාධාර ලබාදීමෙන් සහාය වන අතර විශ්වවිද්‍යාලයෙන් ඔවුන් ලබන දැනුම ස්වකීය කාර්යයන්හිදී ද යොදවා ගනු ලබති. දිනපතා සවස 5 සිට දිනකට පැය 2 1/2 ක කාලයක් දේශනවලට සහභාගී වේ.

වර්තමානයේ දී ආයතනයේ ස්ථිර කථිකාචාර්යවරු තිදෙනෙක් පමණක් සේවයේ යෙදී සිටිති. මීට අමතරව බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ආයතනය විසින් ලබා ගනී. කොන්ත්‍රාත් පදනම මත ආයතනයේ සේවය කරන අධ්‍යයන සම්බන්ධීකාරක විසින් උපාධි වැඩසටහනට අදාළ සියලු වැඩකටයුතු සම්බන්ධීකරණය කෙරේ.

ශ්‍රම අධ්‍යාපනවේදී වැඩසටහනෙහි ප්‍රකටව පෙනෙන කරුණ නම් දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු උපාධි අපේක්ෂකයින් පාඨමාලාවෙන් ලබා ගන්නා දැනුම සෘජුවම තම කාර්යයන්හි දී භාවිත කිරීමයි.

7.2 පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා

භූවිද්‍යා තොරතුරු පද්ධති පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා අංක 02, 2010 වර්ෂයේ අගෝස්තු මස ආරම්භ කරන ලද අතර, පාඨමාලාව සඳහා සිසුන් 41 දෙනෙකු තෝරා ගන්නා ලදී.

7.3 ඩිප්ලෝමා පාඨමාලා

රටේ වර්තමාන අවශ්‍යතාවය සඳහා ආයතනය විසින් 2010 වර්ෂයේ පහත දැක්වෙන අභ්‍යන්තර ඩිප්ලෝමා පාඨමාලා පවත්වා ඇත. මේ සඳහා පාඨමාලා ශාස්ත්‍ර විද්‍යාර්ථීන් විසින් ගෙවනු ලබයි.

2010 වර්ෂය තුළ ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලියාපදිංචි විද්‍යාර්ථීන් සංඛ්‍යාව

පාඨමාලාව	ලියාපදිංචි විද්‍යාර්ථීන් සංඛ්‍යාව
මත්ද්‍රව්‍ය දුර්භාවිත කළමනාකරණ අධ්‍යයන ඩිප්ලෝමා පාඨමාලාව (DDAMS)	55
සෞඛ්‍ය ප්‍රවර්ධන ඩිප්ලෝමා පාඨමාලාව (DHP)	35
ජාත්‍යන්තර ව්‍යාපාර ඩිප්ලෝමා පාඨමාලාව (DIB)	28

7.4 සහතිකපත් පාඨමාලා

7.4.1 ඉංග්‍රීසි භාෂා වැඩසටහන

ඉංග්‍රීසි භාෂා සහතිකපත්‍ර පාඨමාලා අංක 30, 2010 වර්ෂයේ දී සම්පූර්ණ කරන ලදී. එහි උසස්, අන්තර්මධ්‍යම සහ මූලික මට්ටම්වල අවසන් පරීක්ෂණ 2010 ඔක්තෝබර් මස 03, 10 සහ 17 යන දිනයන්හ දී පැවැත්විණ. ගුරුවරුන් සඳහා වූ ඉංග්‍රීසි භාෂා සහතිකපත්‍ර පාඨමාලා අංක 08 හි I, II සහ III වන කොටස් සඳහා අවසන් පරීක්ෂණ 2010 දෙසැම්බර් මස 30 වන දින පවත්වන ලදි. ඉංග්‍රීසි භාෂා සහතිකපත්‍ර පාඨමාලා අංක 30 සහ ගුරුවරුන් සඳහා වූ ඉංග්‍රීසි භාෂා සහතිකපත්‍ර පාඨමාලා අංක 08 පිළිබඳ තොරතුරු පහත දැක්වෙන වගුවල දක්වා ඇත.

ඉංග්‍රීසි භාෂා වැඩසටහන් - 2010

පාඨමාලාව	මාධ්‍යය	2010 නව බඳවා ගැනීම	මූලික		අන්තර්මධ්‍යම		උසස්		සමත් මුළු විද්‍යාර්ථීන් සංඛ්‍යාව
			ලියාපදිංචි විද්‍යාර්ථීන් සංඛ්‍යාව	සමත්	ලියාපදිංචි විද්‍යාර්ථීන් සංඛ්‍යාව	සමත්	ලියාපදිංචි විද්‍යාර්ථීන් සංඛ්‍යාව	සමත්	
ඉංග්‍රීසි භාෂා සහතිකපත්‍ර පාඨමාලා අංක 30	ඉංග්‍රීසි	3865	1398	1051	1685	1212	782	534	2797
ගුරුවරුන් සඳහා වූ ඉංග්‍රීසි භාෂා සහතිකපත්‍ර පාඨමාලා අංක 08	ඉංග්‍රීසි	264	58	37	118	83	88	60	180

ඉංග්‍රීසි භාෂා වැඩසටහන් - අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය - 2010

පාඨමාලාව	අධ්‍යයන කාර්ය මණ්ඩලය	අනධ්‍යයන කාර්ය මණ්ඩලය
ඉංග්‍රීසි භාෂා සහතිපත්‍ර පාඨමාලා අංක 30	78*	03
ගුරුවරුන් සඳහා වූ ඉංග්‍රීසි භාෂා සහතිපත්‍ර පාඨමාලා අංක 08	05*	03

* බාහිර උපදේශකවරු

2010 සැප්තැම්බර් මස 19 වන දින ඉංග්‍රීසි භාෂා සහතිකපත්‍ර පාඨමාලා අංක 31 සඳහා සිසුන් බඳවා ගැනීම සඳහා පවත්වන ලද වර්ගීකරණ පරීක්ෂණයේදී, ඉංග්‍රීසි භාෂා දැනුම, දක්ෂතාවය අනුව විද්‍යාර්ථීහු මට්ටම් 3 කට වර්ගීකරණය කරනු ලැබූහ.

ඉංග්‍රීසි භාෂා පාඨමාලා ශාස්ත්‍ර පීඨයට අයත් පරිශ්‍රයේ දී පවත්වන ලද අතර ඒ සඳහා පංති කාමර සහ දේශන ශාලා මෙන්ම සේවකයින්ට ද සාධාරණ මුදලක් ගෙවනු ලැබීය. සියලු ආචාර්යවරුන් බාහිර උපදේශකයන් ලෙස පත් කළ අතර ආචාර්ය බී. එම්. කිරිබණ්ඩා මහතා පාඨමාලා සම්බන්ධීකරණය පිණිස පත් කරන ලදී.

7.4.2 දෙමළ භාෂා වැඩසටහන

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සමග ඒකාබද්ධව රජයේ නිලධාරීන්ට සහ පාසල් හැරයන යෞවන යෞවනියන් සඳහා 2007 වර්ෂයේ දී නව වැඩසටහනක් ආරම්භ කරන ලදී. රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ජාතික විභාග සඳහා විද්‍යාර්ථීන් සූදානම් කිරීම පිණිස සිංහල භාෂාව කතා කරන විද්‍යාර්ථීන් අරමුණු කොට ගෙන පොදු විෂය නිර්දේශයකට අනුව මෙම වැඩසටහන සැලසුම් කරනු ලැබීය. අඩු ගාස්තු අය කිරීම සහ ඉහළ සම්මතයක් පවත්වාගෙන යාම ජාතික සේවය අතින් සලකන කල ඉතාමත් වැදගත් බව සඳහන් කළ යුතු ය. ග්‍රාමීය විද්‍යාර්ථීන්ට ද මෙම පාඨමාලාවට අයදුම් කිරීමට අවස්ථාව හිමි වී ඇත.

දෙමළ භාෂා පාඨමාලා අංක - 5, 2010 වර්ෂයේ දී සම්පූර්ණ කරන ලදී. එහි අවසාන විභාගය 2010 නොවැම්බර් මස දී පවත්වනු ලැබීය. මෙම පාඨමාලාව සහ මෙම වර්ෂයේදී ආරම්භ කරන ලද අනෙකුත් දමිළ භාෂා පාඨමාලා පිළිබඳ තොරතුරු පහත වගු දෙකෙහි දක්වා ඇත.

දෙමළ භාෂා පාඨමාලා අංක 5 සහ දෙමළ භාෂා වැඩමුළු – අංක 05_01, 2010 වර්ෂයේ දී සම්පූර්ණ කරන ලදී. අදාළ තොරතුරු පහත සඳහන් වගුවෙන් දැක්වේ.

දෙමළ භාෂා පාඨමාලාවන් සමත් වූ විද්‍යාර්ථීන් - 2010

පාඨමාලාව	මාධ්‍යය	2010 නව බඳවා ගැනීම	මූලික	අන්තර්මධ්‍යම	උසස්	සමත් වූ විද්‍යාර්ථීන් සංඛ්‍යාව
දෙමළ භාෂා පාඨමාලා - අංක 5	දෙමළ	1100	956	109	35	786
දෙමළ භාෂා වැඩමුළු - අංක 05_01	දෙමළ	30	30	-	-	29

දෙමළ භාෂා වැඩසටහන් - 2010

පාඨමාලාව	ලියාපදිංචි විද්‍යාර්ථීන් සංඛ්‍යාව	අධ්‍යයන කාර්ය මණ්ඩලය	අනධ්‍යයන කාර්ය මණ්ඩලය
දෙමළ භාෂා පාඨමාලා අංක 5	1100	20*	01
දෙමළ භාෂා පාඨමාලා අංක 5A	34	01*	01
දෙමළ භාෂා වැඩමුළු – අංක 05_01	30	04*	01

* බාහිර උපදේශකවරු

7.4.3. ව්‍යාපාරික කටයුතු සඳහා පරිගණක භාවිතයන් සහතික පත්‍ර පාඨමාලාව

ව්‍යාපාරික කටයුතු සඳහා පරිගණක භාවිතයන් සහතික පත්‍ර පාඨමාලාව (CertCAB) අංක 3, 2010 වර්ෂයේ දී සම්පූර්ණ කරන ලද අතර, එහි අවසාන විභාග 2010 ජූලි සහ ඔක්තොබර් මාස වලදී පවත්වන ලදි.

ව්‍යාපාරික කටයුතු සඳහා පරිගණක භාවිතයන් සහතික පත්‍ර පාඨමාලාව - 2010

පාඨමාලාව	මාධ්‍යය	2010 නව බඳවා ගැනීම	සමත් මුළු විද්‍යාර්ථීන් සංඛ්‍යාව
ව්‍යාපාරික කටයුතු සඳහා පරිගණක භාවිතයන් සහතික පත්‍ර පාඨමාලාව - අංක 3 (CertCAB)	ඉංග්‍රීසි	83	50

පරිගණක භාවිතයන් සහතික පත්‍ර පාඨමාලාවේ (CCCA) හතරවන කණ්ඩායම 2010 සැප්තැම්බර් මස බඳවා ගන්නා ලදි. සිසුන් 46 ක් පාඨමාලාවට ලියාපදිංචි විය.

08. පර්යේෂණ නවප්‍රජනන හා ප්‍රකාශන පිළිබඳ විස්තර

එම්. ජී. ජී. හේමකුමාර මහතා	The effectiveness of Television Advertising in Rural Markets in Sri Lanka (පත්‍රිකාව 2010 නොවැම්බර් මස 29 වැනි දින ඉන්දියාවේ මහත්මා ගාන්ධි විශ්වවිද්‍යාලයේ පැවති අන්තර්ජාතික සම්මේලනයට ඉදිරිපත් කරන ලදි.)

09. පුස්තකාලය

මානව සම්පත් අභිවර්ධන ආයතනය 1975 සිට පුස්තකාල සේවා සැපයීම සිදු කරන අතර එය පොත් 23000කින් පමණ හා හත් දෙනෙකුගෙන් යුත් කාර්ය මණ්ඩලයකින් සමන්විතය. මෙය 2002 වර්ෂයේ සිට අධ්‍යාපන පීඨයේ තාවකාලික ගොඩනැගිල්ලක පිහිටුවනු ලැබ තිබේ. ශ්‍රම අධ්‍යාපනය පිළිබඳ ඉතා දුර්ලභ පොත්වලින් යුතු මෙම වටිනා සම්පත විශ්වවිද්‍යාලයීය ප්‍රජාවගේ උපයෝගිකරණය සඳහා ඉතා ඉක්මනින්ම ප්‍රතිසංවිධානය කළ යුතුව තිබේ.

2010 දී එක් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයකුගෙන්, එක් පුස්තකාල සහායකයකුගෙන් හා සුළු සේවකයන් දෙදෙනෙකුගෙන් ස්ථිර කාර්ය මණ්ඩලය සමන්විත විය. එයට අමතරව කාර්ය පැවරුම් පදනම මත සේවය කරන ව්‍යාපෘති සහකරුවන් දෙදෙනෙක් හා පුහුණු වන පරිගණක යෙදවුම් සහකරුවන් එක් අයකුද සිටි.

අංශය	ජ්‍යෙෂ්ඨතම	ජ්‍යෙෂ්ඨ	කනිෂ්ඨ	සුළු සේවකයින්	එකතුව
පුස්තකාලය	01	-	04*	02	07

*තාවකාලික පදනම මත

2010 වසරේදී පුස්තකාලයේ සාමාජික සංඛ්‍යාව 654ක් වූ අතර එහි සිසුන් 593ක්, අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 61ක් විය. 2010 වසරේදී බැහැර දීමේ පොත් 16904ක් හා විමර්ශන පොත් 5400ක් විය. එසේම 2010 වසරේදී පුස්තකාලය සඳහා රුපියල් 171,435.95ක් වැය කර නව පොත් 317ක් මිලදී ගන්නා ලදී. ප්‍රදාන ලෙස පොත් 20ක් ලැබිණි. ආයතනය 2010 වසරේදී වාර සඟරා මිලදී ගැනීම සඳහා රුපියල් 66,705.00ක් වැය කරන ලදී.

සමස්ථ නිකුත් කිරීම්– 2010

පොත් බෙදා හැරීම	ශිෂ්‍යයින්ට	කාර්ය මණ්ඩලයට	එකතුව
භාරදීම	2463	457	2920
නිකුත් කිරීම්	2150	398	2548

2010 වසරේදී පුස්තකාලයේ ආදායම

ආදායම	රුපියල්
ඡායා පිටපත් සේවය	රු. 19,783.50
දඩ	රු. 10,159.00
පොත් අස්ථාන ගතවීම්	රු. 2,121.87
සාමාජික පත්‍රිකා අස්ථාන ගතවීම්	රු. 350.00
එකතුව	රු. **32,414.37**

10. මූල්‍ය ක්‍රියාකාරකම්

2010 වර්ෂය සඳහා සමස්ත රාජ්‍ය ප්‍රතිපාදනය රුපියල් මිලියන 23 ක් පමණ විය. ආයතනය විසින් උපයන ලද අදායම රුපියල් මිලියන 41 කි.

2010 වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳ ප්‍රධාන කරුණු

අදායම - රු 1000/-			වියදම - රු 1000/-		
01	රාජ්‍ය ප්‍රතිපාදන - පුනරාවර්තන	19,000	01	වේතන - අධ්‍යයන	4,541
02	රාජ්‍ය ප්‍රතිපාදන - ප්‍රාග්ධන	3,950	02	වේතන - අනධ්‍යයන	11,489
03	රාජ්‍ය පරිගණක ශිල්පීය ප්‍රතිපාදන	-	03	බාහිර කථිකාචාර්යවරුන්	427
04	ව්‍යාප්ති පාඨමාලා ආදායම	40,951	04	ගිවිසුම් සේවා	2,331
05	වෙනත් ආදායම (පුනරාවර්තන වියදම් සඳහා)	4,606	05	නඩත්තු වියදම්	584
06	වෙනත් ආදායම් (ප්‍රාග්ධන වියදම් සඳහා)	-	06	මිලට ගැනීම් - ප්‍රාග්ධන	5,506
07		-	07	ව්‍යාප්ත පාඨමාලා සඳහා වූ වියපැහැදම්	35,776
08			08	වෙනත් වියදම් උපාධි ප්‍රදානෝත්සවය ආදිය සඳහා	3,246
වෙනත්					
01	සමස්ත ශුද්ධ ප්‍රාග්ධන වත්කම්	24,876	01	අයිතිවාසිකම් සහ වගකීම්	91,556
	වර්තමාන වත්කම්	66,689			
එකතුව		155,466		එකතුව	155,466

මානව සම්පත් අභිවර්ධන ආයතනය
කොළඹ විශ්ව විද්‍යාලය

2010 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන මුදල් වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	2010	2010	2009	2009
වත්කම්					
ජංගම නොවන වත්කම්					
ඉඩම්, යන්ත්‍රාගාර සහ උපකරණ	1	25,693,707.91		24,437,205.94	
ආයෝජන	2	51,130,552.18		31,134,255.32	
			76,824,260.09		55,242,742.27
වර්තමාන ජංගම වත්කම	4				
භාණ්ඩ ලේඛන/තොග	4ඒ	629,775.04		831,279.01	
වෙළෙඳ සහ සෙසු ලැබීම්	4බී	5,741,891.77		4,615,281.15	
පෙර ගෙවීම්	4සී	-		17,043.98	
මුදල් සහ මුදල් සමතුල්‍යයන්	4ඩී	9,187,068.77		6,244,682.80	
			15,558,735.58		11,708,286.94
මුළු වත්කම්			92,382,995.67		66,951,029.21
වගකීම්					
භාවිත වගකීම්	5				
ගෙවීම්	5ඒ	8,025,612.61		5,811,068.12	
උපචිත ගෙවීම්	5බී	324,933.30		332,181.69	
			8,350,545.91		6,143,249.81
භාවිත නොවන ගෙවීම්	6				
ගෙවීම්	6ඒ	48,481,489.43		29,952,904.64	
විචල්‍ය ආදායම්	6බී	20,745,442.15		19,164,429.60	
පාරිතෝෂික විධිවිධාන	6සී	6,730,825.00		5,923,905.00	
			75,957,756.58		55,041,239.24
මුළු ගෙවීම්			84,308,302.49		61,184,489.05
මුළු ශුද්ධ වත්කම්			8,074,693.18		5,766,540.16
ශුද්ධ වත්කම්/සම වත්කම්	7				
වියදම් නොකළ ප්‍රාග්ධන ප්‍රතිපාදන	7ඒ	1,705,837.65		269,273.56	
එකතු වූ අරමුදල්	7බී	6,355,993.33		5,488,562.81	
සංචිත-පරිත්‍යාග	7සී	18,862.20		8,703.80	
මුළු ශුද්ධ වත්කම්/ සම වත්කම්			8,074,693.18		5,766,540.17

ජේ.එස්.වී.එන්.ටී සොයිසා
ජ්‍යෙෂ්ඨ සහකාර මුල්‍යාධිකාරී

ආචාර්ය ඩබ්. කේ. හිරිඹුරේගම
අධ්‍යක්ෂ

මානව සම්පත් අභිවර්ධන ආයතනය
කොළඹ විශ්ව විද්‍යාලය

2010 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය තුළ කාර්ය සාධනය සඳහා වූ මුදල් ප්‍රකාශය

සටහන		2010	2009
මෙහෙයුම් ආදායම			
රජයේ ආධාර පුනරාවර්තන		19,000,000.00	16,806,000.00
ක්‍රමක්ෂය රජයේ ආධාර ක්ෂයවීම	6බී7බී	4,923,110.96	4,093,672.56
ආදායම-වෙනත් ආදායම	8ඒ	40,951,198.29	39,492,011.86
		64,874,309.25	60,391,684.42
මෙහෙයුම් වියදම්			
කාර්යමණ්ඩල වැටුප්	9ඒ	16,456,882.47	15,604,513.75
ගමනාගමන වියදම්	9බී	24,595.00	5,453.00
සැපයුම් සහ පරිභෝජන	9සී	1,860,364.80	1,771,873.91
නඩත්තු කාර්යයන්	9ඩී	584,105.94	855,850.84
ගිවිසුම් සේවා	9ඊ	2,331,375.30	1,993,038.84
සෙසු මෙහෙයුම් වියදම්	9එෆ්	1,209,096.88	1,223,902.97
පාරිතෝෂික	9ජී	806,920.00	490,022.50
ක්ෂය වීම්	9එච්	4,923,110.96	4,093,672.56
ව්‍යාපෘති වැඩසටහන් පිළිබඳ වියදම්	9අයි	35,775,983.84	29,825,882.84
අපහරණය සහ පොතෙන් ලියා අස් කිරීම			
මුළු මෙහෙයුම් වියදම්		63,972,435.19	55,883,249.21
ශුද්ධ අතිරික්තය/කාලපරිච්ඡේදය සඳහා (හිඟය)		901,874.06	4,508,435.21

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனதுஇல / MyNo } සිව්/සී/අයිඑච්ආර්ඒ/10/එෆ්/ඒ

ඔබේ අංකය / உமது இல / Your No. }

දිනය / திகதி / Date } 2011 අගෝස්තු 08 දින

INSTITUTE OF HUMAN RESOURCE ADVANCEMENT
11 AUG 2011
IHRA
DIRECTOR'S OFFICE

අධ්‍යක්ෂ

කොළඹ විශ්වවිද්‍යාලයට අනුයුක්ත මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුයුක්ත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

කොළඹ විශ්වවිද්‍යාලයට අනුයුක්ත මානව සම්පත් අභිවර්ධන ආයතනයේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය ප්‍රකාර පනවන ලද 1979 අංක 11 දරන මානව සම්පත් අභිවර්ධන ආයතන නියමාවලියේ 23 වගන්තිය , විශ්වවිද්‍යාල පනතේ 108(1) සහ 111 වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උප වගන්ති සමඟ සංයෝජිතව කියවියයුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(2) සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ. මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් , යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை
INDEPENDENCE SQUARE, COLOMBO 07, SRI LANKA
දුරකථනය / தொலைபேசி / Telephone } 2691151
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. } 2697451
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail. } oaggov@sltnet.lk

1.3 විගණන විෂය පථය සහ මතය සදහා පදනම්

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබදව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය , අදහස් දැක්වීම් සහ සොයාගැනීම් , විගණනය සදහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව විගණනය සිදුකරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සදහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සදහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මගින් සපයන බව මාගේ විශ්වාසයයි. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සදහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, කොළඹ විශ්වවිද්‍යාලයට අනුයුක්ත මානව සම්පත් අභිවර්ධන ආයතනය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සදහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් , මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුයුක්ත මානව සම්පත් අභිවර්ධන ආයතනයයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සදහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

විගණනය සඳහා 2011 මාර්තු 01 දින ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල පැවති ගිණුම්කරණ දෝෂ ඇතුළත් විගණන විමසුමක් 2011 අප්‍රේල් 19 දින අධ්‍යක්ෂකවරයා වෙත යවන ලද අතර ඒ අනුව සංශෝධිත මූල්‍ය ප්‍රකාශ 2011 මැයි 05 දින විගණනය වෙත ඉදිරිපත් කරන ලදි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

2.2.3 හඳුනා නොගත් ශේෂ

2010 දෙසැම්බර් 31 දිනට වන විට දිගින් දිගටම පැවති එන අත්තිකාරම් ගිණුම් 3ක රු. 200,166 ක් වූ ශේෂ හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 අය නොවී පවතින ශේෂ

2010 දෙසැම්බර් 31 දිනට ගිණුම් 3ක රු.257,853 ක ශේෂ වසර 02 සිට වසර 04ක කාලයක් දක්වා අය නොවී පැවතුනි.

2.2.5 නීති,රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

නීති ,රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

නීති,රීති,රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම
2003 ජුනි 02 දිනැති අංක පීඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය	මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.
2004 ජුලි 29 දිනැති අංක පීඩී 25 දරණ චක්‍රලේඛය	ආයතනය විසින් තම අරමුදල් ආයෝජනය කිරීමේදී මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු වුවත් 2009 වර්ෂයේදී ආයෝජනය කර තිබූ රු. 6,000,000 ක් සහ 2010 වර්ෂයේදී ආයෝජනය කර තිබූ රු.9,200,0000 ක් වූ ස්ථාවර

තැන්පතු සම්බන්ධයෙන් එකී අනුමැතිය ලබාගෙන නොතිබුණි.

2.2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තොර ගනුදෙනු

2010 අධ්‍යයන වර්ෂයේ ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවේ අයදුම්පත් ගාස්තු ලෙස අයදුම්කරුවෙකුගෙන් රු.500 බැගින් අයදුම්කරුවන් 826 දෙනෙකුගෙන් රු. 413,000 ක් අය වී තිබූ අතර එම මුදලින් 1994 ජුනි 14 වැනි දිනැති හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 95 හි විධිවිධාන වලින් බැහැරව විභාග අධීක්ෂණය, උත්තර පත්‍ර පරීක්ෂාව, නිවාඩු දින දීමනා, අතිකාල දීමනා වැනි වියදම් දරා තිබුණි.

1994 ජුනි 14 වැනි දිනැති හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 95 ට පටහැනිව 2010 ශ්‍රම අධ්‍යාපනවේදී පාඨමාලා ආදායමෙන් රු.167,800ක් ශිෂ්‍ය සුභසාධනය සඳහා වූ ව්‍යාපෘතියේ සේවය කළ නිලධාරීන්ටද දීමනා ලෙස ගෙවා තිබුණි. ශ්‍රම අධ්‍යාපනවේදී පාඨමාලාවට එම නිලධාරීන්ගේ අවශ්‍යතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.

3. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු. 18,098,126 ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා ඊට අනුරූප ඌනතාවය රු. 12,297,565 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 5,800,561කින් වැඩි වී තිබුණි. පුනරාවර්තන වියදම් සඳහා රු. 19,000,000ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.901,874ක අතිරික්තයක් බවට පත් වී තිබූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු. 16,806,000 ක්වූ රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂය සඳහා වූ ඌනතාවය රු. 4,508,435 ක අතිරික්තයක් බවට පත් වී තිබුණි.

ඉකුත් වර්ෂයට අනුව සමාලෝචිත වර්ෂයේ රු. 3,606,561ක අතිරික්තයේ අඩුවීමක් සඳහා 4,482,625 ක ආදායම වැඩිවීමට සාපේක්ෂව 8,089,186 ක වියදම වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.

3.1.1 මතභේදයට තුඩුදෙන ගනුදෙනු.

1994 ජුනි 14 දින හා අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කළ චක්‍රලේඛයක් පදනම් කරගෙන දෙවන හා තෙවන භාෂා ප්‍රවීනත්වය

වෙනුවෙන් වැටුප් හා දිරිදීමනා වශයෙන් 2010 වර්ෂයේ දී රු.78,450 ක් ගෙවා තිබුණි.මෙම දීමනා ගෙවීම රජයේ නීතිරීතීන්ට පටහැණි බවට රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයා හා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දන්වා තිබුණු නමුත් එම ගෙවීම අඛණ්ඩව සිදු කරමින් පැවතුණි.

3.2 මෙහෙයුම් සමාලෝචනය

3.2.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආයතනය විසින් පවත්වනු ලබන ප්‍රධාන උපාධි පාඨමාලාව වන ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව සඳහා 2010 වර්ෂයේ ලියාපදිංචි නවක සිසුන් සංඛ්‍යාව 126 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට වඩා සිසුන් 44කගේ අඩුවීමක් විය.

(ආ) 2010 වර්ෂය තුළ දී මුදල් අය කිරීමේ පාඨමාලා 18 ක් පවත්වා තිබුණ අතර ඒ සඳහා සහභාගි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 9,319කි. විභාගයන්ට පෙනී නොසිටි ශිෂ්‍ය සංඛ්‍යාව 576 ක් වූ අතර එය මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 6% ක් විය. අසමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව 576 ක් වූ අතර එය මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 6% ක් විය. විභාගයන් 06 ක් පවත්වා මාස 04 සිට මාස 10 දක්වා කාලයක් ගත වී තිබුණද ප්‍රතිඵල නිකුත් කර නොතිබුණි.

(ඇ) මුදල් අය කිරීමේ පාඨමාලා ගාස්තු වශයෙන් රු.54,497,829 ක් 2010 වර්ෂය තුළ ලැබී තිබූ අතර එය ඉකුත් වර්ෂය හා සසඳන විට 14% ක වැඩිවීමක් විය.

(ඇ) ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාව සඳහා 2010 වර්ෂයේ දී වෙන් කරන ලද පැය ගණන පැය 1,107.5 ක් වූ අතර එය සෙමෙස්තර ක්‍රමය අනුව තීරණය විය. ඒ අනුව වෙන් කරන ලද පැය ගණනෙහි පෙර වර්ෂයට වඩා දේශන පැය 417.5ක වැඩිවීමක් විය. එසේම 2010 වර්ෂය තුළදී පැවැත්වූ තථ්‍ය මුළු දේශන පැය ගණන ද පැය 1,107.5 ක් වූ අතර එය පෙර වර්ෂය හා සසඳන විට පැය 658.5 ක වැඩිවීමක් විය. පවත්වන ලද දේශන පැය ගණනින් පැය 423 ක් ආයතනයේ අභ්‍යන්තර දේශකයින් පස් දෙනෙකු විසින් ද පැය 724.5 ක් බාහිර දේශකයින් 24 දෙනෙකු විසින් ද පවත්වා තිබුණි. මේ අනුව පෙර වර්ෂය හා සසඳන විට අභ්‍යන්තර දේශකයින් විසින් පවත්වන ලද දේශන පැය 254ක වැඩිවීමක් සහ බාහිර දේශකයින් විසින් පවත්වන ලද දේශන පැය 444.5ක වැඩිවීමක්ද විය. මුළු දේශන පැය ගණනින් අභ්‍යන්තර දේශකයින් පවත්වා තිබුණු දේශන පැය ප්‍රමාණය 37% ක් විය.

3.2.2 ඌන උපයෝජිත වත්කම්

2007 සැප්තැම්බර් හා 2008 පෙබරවාරි යන මාස වලදී රු. 330,155 කට මිලදී ගත් ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර තුනෙන් දෙකක් අළුත් වැඩියා කළ නොහැකි තත්වයේ පැවති බැවින් 2008 වර්ෂයේ සිටම භාවිතයට ගෙන නොතිබුණි.

3.2.3 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර් සැලැස්ම.

2003 ජුනි 02 දින දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී 12 හි 5 වන පරිච්ඡේදයේ 5.1.3 ඡේදයට අනුව සංයුක්ත සැලැස්ම වාර්ෂිකව සකස් කළ යුතු වුවද 2009 වර්ෂයේ සිට සංයුක්ත සැලැස්මක් හෝ එම වර්ෂ සඳහා ක්‍රියාකාර් සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එබැවින් ආයතනය විසින් ඒ ඒ වර්ෂයන් තුළදී ළඟා කර ගැනීමට බලාපොරොත්තු වූ අභිමතාර්ථ හා ඉලක්ක මොනවාද යන වග හා එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය පරීක්ෂා කළ නොහැකි විය.

3.2.4 අයවැය ලේඛනය.

පීඊඩී 12 ට අනුව සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර් සැලැස්ම පිළියෙල කර එය පදනම් කර වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කළ යුතු වුවද ආයතනය විසින් ඉහත සැලැසුම් වලින් තොරව අයවැය ලේඛනය පිළියෙල කර තිබුණි.

4. පද්ධති හා පාලන

පහත සඳහන් පාලන ක්ෂේත්‍රය කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) විභාග කටයුතු
(ආ) ස්ථාවර වත්කම් ලේඛනගත කිරීම

එච්.ඒ.එස් සමරවීර
වැඩ බලන විගණකාධිපති

මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස්	2013 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්වය හා සංවර්ධනය
2 මූල්‍ය ප්‍රකාශන 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම 2.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම	විගණනය සඳහා 2011 මාර්තු 01 දින ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වල පැවති ගිණුම්කරණ දෝෂ ඇතුළත් විගණන විමසුමක් 2011 අප්‍රේල් 19 දින අධ්‍යක්ෂකවරයා වෙත යවන ලද අතර ඒ අනුව සංශෝධිත මූල්‍ය ප්‍රකාශ 2011 මැයි 05 දින විගණනය වෙත ඉදිරිපත් කරන ලදි		
2.2.2 ගිණුම්කරණ අඩුපාඩු 2.2.3 හඳුනා නොගත් ශේෂ	2010 දෙසැම්බර් 31 දිනට වන විට දිගින් දිගටම පැවති එන අත්තිකාරම් ගිණුම් 3 ක රු. 200,166 ක් වූ ශේෂ හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම ශේෂයන් ලියා හැරීම සඳහා කළමණාකාර මණ්ඩලයෙන් සහ ශාස්ත්‍රිය කමිටු නිර්දේශයන් භාණ්ඩාගාරයට දන්වා ඇත.	වසර 11 ක සිට පැවතෙන මෙය විවිධ අත්තිකාරම් ගිණුමේ ශේෂයකි. මෙම ශේෂය සොයාගැනීමට වර්තමානයේ ලිපි ලේඛන නොමැති බැවින් මෙම ශේෂයන් ලියා හැරීමට අනුමැතිය ලබා ගැනීමට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇත. (ඇමුණුම 01)

මුල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස්	2013 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්වය හා සංවර්ධනය
2.2.4 අය නොවී පවතින ශේෂ	2010 දෙසැම්බර් 31 දිනට ගිණුම් 3 ක රු. 257,853 ක ශේෂ වසර 02 සිට වසර 04 ක කාලයක් දක්වා අය නොවී පැවතුනි.	(i) එම් එස් සි පෙරේරා මහතා . නිසි පරිදි වැටුප් රහිත නිවාඩු අනුමත කර ගෙන දැනට විදේශගතව සිටින අතර ඔහු නැවත සේවයට පැමිණි පසු වැටුප් ගෙවීමේදි එම ණය අඩු කිරීමට කටයුතු කරනු ඇත.	අයනොවී පවතින ණය ශේෂයන්ගෙන් එම් එස් සි පෙරේරා සහ එම් පි පි ඩි මැණිකේ මිය ගේ අදාළ ණය මුදල් රිසිට් අංක 100324, 100198 යටතේ ගෙවා ඇත.
		(ii) එම් පි පි ඩි මැණිකේ මිය මෙම ණය මුදල අදාල විශ්වවිද්‍යාලය මඟින් පවරා ගෙන ඇත. රිසිට් අංක 100198	අයනොවී පවතින ණය ශේෂයන් අතර රු. 191,100.00 ක් වන අපදා ණය වි අයි ඩි ජේ පෙරේරා මහතා ගෙන් අයවිය යුතු වේ. ඒ මහතා සම්බන්ධව අධිකරණයේ නඩුවක් පවතින අතර අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදි එම ණය අඩු කිරීමට නිසි පරිදි කටයුතු කරනු ඇත.
2.2.4 අය නොවී පවතින ශේෂ		(iii) වි අයි ඩි ජේ පෙරේරා මහතා ඒ මහතා සම්බන්ධව අධිකරණයේ නඩුවක් පැවැති අතර අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේදි එම ණය අඩු කිරීමට නිසි පරිදි කටයුතු කරනු ඇත.	

මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස්	2013 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්වය හා සංවර්ධනය
2.2.5 නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තිරණ වලට අනුකූල නොවීම නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවු අවස්ථා පහත දැක්වේ. අනුකූල නොවීම		
(i) 2003 ජුනි 02 දිනැති අංක/පීඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදය	මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.	වාර්ෂික වාර්තාව සකස් කර කෙටුම්පත පරිවර්තනයට යවා ඇත.	2008 වාර්ෂික වාර්තාව උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට යවා ඇත. 2009,2010 වාර්ෂික වාර්තා ඉතා ඉක්මනින් ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස්	2013 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්වය හා සංවර්ධනය
(ii) 2004 ජූලි 29 දිනැති අංක/පීඑඩ් 25 දරන චක්‍රලේඛය	ආයතනය විසින් තම අරමුදල් ආයෝජනය කිරීමේදී මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතු වුවත් 2009 වර්ෂයේදී ආයෝජනය කර තිබූ රු. 6,000,000 ක් සහ 2010 වර්ෂයේදී ආයෝජනය කර තිබූ රු. 9,200,000 ක් වූ ස්ථාවර තැන්පතු සම්බන්ධයෙන් එකී අනුමැතිය ලබාගෙන නොතිබුණි.	අනුමැතිය ලබාගැනීම සඳහා ලිපියක් යවා ඇත.	ආයතනයේ පාඨමාලා සඳහා ලැබෙන මුළු මුදල් වලින් අදාළ කාලයට අවශ්‍ය මුදල් රඳවාගෙන අනාගතයේ වැයකිරීමට සිදුවන මුදල් ප්‍රමාණය කෙටිකාලීන තැන්පතුවල රඳවා ඇත. අදාළ පාඨමාලාව අවසන් වන විට එම තැන්පතුවල ඇති මුදල් අදාළ පාඨමාලාවල වියදම් පියවීමට යොදාගනු ලැබේ. තවද ආයතනයට ලැබෙන රාජ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන නිසා තැන්පතුවලින් ලැබෙන පොලියෙන් ආයතනයේ නඩත්තු කාර්යයන් හා ආයතනයේ උපාධි පාඨමාලාවේ වියදම් ද මෙමඟින් දරණු ලැබේ. එම නිසා මෙම තැන්පතුවලින් තොරව ආයතනයේ කටයුතු පවත්වා ගැනීම කළ නොහැක. ආයතනයේ කටයුතු කාර්යක්ෂමව රජයට වැය බරක් නොවී පවත්වා ගෙනයාම සඳහා අදාළ අනුමැතිය ලබාගැනීමට 2012 අගෝස්තු 06 වන දින විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශය මත භාණ්ඩාගාරය වෙත දන්වා යවා ඇත. (ඇමුණුම 02)

මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස්	2013 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්වය හා සංවර්ධනය
2.2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තොර ගනුදෙනු	2010 අධ්‍යයන වර්ෂයේ ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පාඨමාලාවේ අයදුම්පත් ගාස්තු ලෙස අයදුම්කරුවෙකුගෙන් රු. 500 බැගින් අයදුම්කරුවන් 826 දෙනෙකුගෙන් රු. 413,000 ක් අය වී තිබූ අතර එම මුදලින් 1994 ජුනි 14 වැනි දිනැති හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 95 හි විධිවිධාන වලින් බැහැරව විභාග අධීක්ෂණය, උත්තර පත්‍ර පරීක්ෂාව, නිවාඩු දින දීමනා, අතිකාල දීමනා වැනි වියදම් දරා තිබුණි. 1994 ජුනි 14 වැනි දිනැති හා රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 95 පටහැනිව 2010 ශ්‍රම අධ්‍යාපනවේදී පාඨමාලා ආදායමෙන් රු. 167,800 ක් ශිෂ්‍ය සුභසාධනය සඳහා වූ ව්‍යාපෘතියේ සේවය කළ නිලධාරීන්ටද දීමනා ලෙස ගෙවා තිබුණි. ශ්‍රම අධ්‍යාපනවේදී පාඨමාලාවට එම නිලධාරීන්ගේ අවශ්‍යතාවය විගණනයේදී තහවුරු කර ගත නොහැකි විය.	මෙම ආයතනය වෙත රැකියා කරන අයදුම්කරුවන්ගෙන් පාඨමාලාවට තෝරා ගැනීම සඳහා වූ ක්‍රියාවලිය පෙර වර්ෂ වල සිදුකරන ලද ආකාරයටම 2010 වර්ෂය සඳහාද ක්‍රියාත්මක කරන ලදි. මෙම පාඨමාලාව සඳහා ඉල්ලුම් කරන ලද සියළුම අපේක්ෂකයින් රැකියා කරන්නන් හෙයින් සතියේ දිනවල පරීක්ෂණයක් හෝ සම්මුඛ පරීක්ෂණයක් කිරීම සුදුසු නැත. එම නිසා පරීක්ෂණ, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සඳහා රජයේ නිවාඩු දින හෝ සති අන්තයේ දින තෝරා ගැනේ. මෙම පාඨමාලාවට සුදුස්සන් තෝරා ගැනීම සඳහා රජයේ පුනරාවර්තන ප්‍රතිපාදන වල මුදල් වෙන්කර නැත. මෙය රජයට බරක් නොවනසේ ව්‍යාපෘතියක් ලෙස පෙර වර්ෂ වල මෙන්ම උපයන මුදලින් කරන ව්‍යාපෘතියකි. මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලද අයවැය ඇස්තමේන්තුවක් අනුව ගෙවීම් සිදුකර ඇත්තේ ආයතනයේ අනෙකුත් උපයන මුදලින් කෙරෙන ව්‍යාපෘති වල ආකාරයටමය. මෙය විශේෂිත වූ ව්‍යාපෘති කාර්ය සඳහා අදාල ආචාර්යවරුන්, නිලධාරීන් හා සේවක භවතුන් වෙත මුදල් කමිටුවේ නිර්දේශය හා 2010.11.03 දිනැති 306 වන ශාස්ත්‍රීය කමිටුව අනුමත අයවැය අනුව මෙම ගෙවීම් සිදුකර ඇත.	මෙම ආයතනය වෙත රැකියා කරන අයදුම්කරුවන්ගෙන් පාඨමාලාවට තෝරා ගැනීම සඳහා වූ ක්‍රියාවලිය පෙර වර්ෂ වල සිදුකරන ලද ආකාරයටම 2010 වර්ෂය සඳහාද ක්‍රියාත්මක කරන ලදි. මෙම පාඨමාලාව සඳහා ඉල්ලුම් කරන ලද සියළුම අපේක්ෂකයින් රැකියා කරන්නන් හෙයින් සතියේ දිනවල පරීක්ෂණයක් හෝ සම්මුඛ පරීක්ෂණයක් කිරීම සුදුසු නැත. එම නිසා පරීක්ෂණ, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම සඳහා රජයේ නිවාඩු දින හෝ සති අන්තයේ දින තෝරා ගැනේ. මෙම පාඨමාලාවට සුදුස්සන් තෝරා ගැනීම සඳහා රජයේ පුනරාවර්තන ප්‍රතිපාදන වල මුදල් වෙන්කර නැත. මෙය රජයට බරක් නොවනසේ ව්‍යාපෘතියක් ලෙස පෙර වර්ෂ වල මෙන්ම උපයන මුදලින් කරන ව්‍යාපෘතියකි. මුදල් කමිටුව විසින් නිර්දේශ කරන ලද අයවැය ඇස්තමේන්තුවක් අනුව ගෙවීම් සිදුකර ඇත්තේ ආයතනයේ අනෙකුත් උපයන මුදලින් කෙරෙන ව්‍යාපෘති වල ආකාරයටමය. මෙය විශේෂිත වූ ව්‍යාපෘති කාර්ය සඳහා අදාල ආචාර්යවරුන්, නිලධාරීන් හා සේවක භවතුන් වෙත මුදල් කමිටුවේ නිර්දේශය හා 2010.11.03 දිනැති 306 වන ශාස්ත්‍රීය කමිටුව අනුමත අයවැය අනුව මෙම ගෙවීම් සිදුකර ඇත. (ඇමුණුම 03)

මුල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම	විගණකාධිපති විසින් පෙන්වා දි ඇති කරුණු	විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස්	2013 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්වය හා සංවර්ධනය
3 මුල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය			
3.1 මුල්‍ය ප්‍රතිඵල	ඉදිරිපත් කරන ලද මුල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනිමට පෙර රු. 18,098,126 ක ඌනතාවයක් වු අතර, ඉකුත් වර්ෂය සඳහා ඊට අනුරූප ඌනතාවය රු.12,297,565 ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු. 5,800,561 කින් වැඩි වී තිබුණි. පුනරාවර්තන වියදම් සඳහා රු. 19,000,000 ක් වු රජයේ ප්‍රදානය හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවය 901,874 ක අතිරික්තයක් බවට පත් වී තිබු අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රු. 16,806,000 ක් වු රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂය සඳහා වු ඌනතාවය රු. 4,508,435 ක අතිරික්තයක් බවට පත් වී තිබුණි. ඉකුත් වර්ෂයට අනුව සමාලෝචිත වර්ෂයේ රු. 3,606,561 ක අතිරික්තයේ අඩුවීමක් සඳහා රු. 4,482,625 ක ආදායම වැඩිවීමට සාපේක්ෂව 8,089,186 ක වියදම වැඩිවීම විශේෂයෙන් බලපා තිබුණි.	එකඟ වේ	එකඟ වේ
3.1.1. මතභේදයට තුඩුදෙන ගනුදෙනු	1994 ජුනි 14 දින හා අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කළ චක්‍රලේඛයක් පදනම් කරගෙන දෙවන හා තෙවන භාෂා ප්‍රවිනත්වය වෙනුවෙන් වැටුප් හා දිරිදීමනා වශයෙන් 2010 වර්ෂයේ දි රු. 78,450 ක් ගෙවා තිබුණි. මෙම දිමනා ගෙවීම රජයේ නිතිරීතින්ට පටහැණි බවට රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයා හා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දන්වා තිබුණු නමුත් එම ගෙවීම අඛණ්ඩව සිදු කරමින් පැවතුණි.	මෙය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර ඇත.	මෙය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කර ඇත.

මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස්	2013 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්වය හා සංවර්ධනය
3.2 මෙහෙයුම් සමාලෝචනය 3.2.1 කාර්යසාධනය අ	පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ. ආයතනය විසින් පවත්වනු ලබන ප්‍රධාන උපාධි පාඨමාලාව වන ශ්‍රම අධ්‍යාපනවේදි උපාධි පාඨමාලාව සඳහා 2010 වර්ෂයේ ලියාපදිංචි සිසුන් සංඛ්‍යාව 126 ක් වූ අතර එය ඉකුත් වර්ෂයට වඩා සිසුන් 44 කගේ අඩුවීමක් විය.	එකඟ වේ. කලින් වසරේ ඩිප්ලෝමා පාඨමාලාව සමත් වී උපාධි පාඨමාලාවට ලියාපදිංචි වූ සිසුන් සංඛ්‍යාවෙහි අඩුවීමකි.	මෙම වසරේ සිට බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව වැඩි කර ඇත. 2012 වන විට 220 ක් ශිෂ්‍ය සංඛ්‍යාවක් බඳවාගෙන ඇත. මෙය 2010 වර්ෂය හා සසඳන විට 74% ක වර්ධනයකි.
කාර්යසාධනය ආ	2010 වර්ෂය තුළදී මුදල් අය කිරීමේ පාඨමාලා 18 ක් පවත්වා තිබුණ අතර ඒ සඳහා සහභාගි වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 9,319 කි. විභාගයන්ට පෙනී නොසිටි ශිෂ්‍ය සංඛ්‍යාව 576 ක් වූ අතර එය මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 6% ක් විය. අසමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව 576 ක් වූ අතර එය මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 6% ක් විය. විභාගයන් 06 ක් පවත්වා මාස 04 සිට මාස 10 දක්වා කාලයක් ගතවී තිබුණද ප්‍රතිඵල නිකුත් කර නොතිබුණි.	එකඟ වේ. විභාගයන් 06 න් 02 ක දැනටමත් ප්‍රතිඵල නිකුත් කර ඇත. අනිකුත් විභාග 04 හි ප්‍රතිඵල කඩිනමින් නිකුත් කිරීමට පියවර ගෙන ඇත. දේශකවරු වැඩි දෙනෙක් ආයතනයෙන් බාහිර කථිකාචාර්යවරු වන අතර ඔවුන්ට ගෙවන ප්‍රමාණ අනුව තදින් කටයුතු කල නොහැක.	වර්තමානය වන විට ආයතනයේ පවත්වා ඇති සියළු විභාගවල ප්‍රතිඵල නිකුත් කර ඇත.
කාර්යසාධනය ඇ	මුදල් අය කිරීමේ පාඨමාලා ගාස්තු වශයෙන් රු. 54,497,829 ක් 2010 වර්ෂය තුළ ලැබී තිබූ අතර එය ඉකුත් වර්ෂය හා සසඳන විට 14% ක වැඩිවීමක් විය.	එකඟ වේ.	එකඟ වේ. රජයේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන බැවින් ආයතනයේ කෙටිකාලීන පාඨමාලා මගින් ඉපයීම් වර්ධනය කර ඇත. ආයතනයේ කටයුතු කාර්යක්ෂමව රජයට වැය බරක් නොවී පවත්වාගෙන යෑමට නම් මෙලෙස ඉපයීම් වර්ධනය කර ගත යුතු වේ.

මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස්	2013 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්වය හා සංවර්ධනය
කාර්යසාධනය ඇ:	ශ්‍රම අධ්‍යාපනවේදි උපාධි පාඨමාලාව සඳහා 2010 වර්ෂයේදි වෙන් කරන ලද පැය ගණන පැය 1,107.5 ක් වූ අතර එය සෙමෙස්තර ක්‍රමය අනුව තිරණය විය. ඒ අනුව වෙන් කරන ලද පැය ගණනෙහි පෙර වර්ෂයට වඩා දේශන පැය 417.5 ක වැඩිවීමක් විය. එසේම 2010 වර්ෂය තුලදි පැවැත්වූ තථ්‍ය මුළු දේශන පැය ගණන පැය 1,107.5 ක් වූ අතර එය පෙර වර්ෂය හා සසඳන විට පැය 658.5 ක වැඩිවීමක් විය. පවත්වන ලද දේශන පැය ගණනින් පැය 423 ක් ආයතනයේ අභ්‍යන්තර දේශකයින් පස් දෙනෙකු විසින් ද පැය 724.5 ක් බාහිර දේශකයින් 24 දෙනෙකු විසින් ද පවත්වා තිබුණි. මේ අනුව පෙර වර්ෂය හා සසඳන විට අභ්‍යන්තර දේශකයින් විසින් පවත්වන ලද දේශන පැය 254 ක වැඩිවීමක් සහ බාහිර දේශකයින් විසින් පවත්වන ලද දේශන පැය 444.5 ක වැඩිවීමක්ද විය. මුළු දේශන පැය ගණනින් අභ්‍යන්තර දේශකයින් පවත්වා තිබුණු දේශන පැය ප්‍රමාණය 37% විය.	එකඟ වේ. 2006/07 අධ්‍යයන වර්ෂයේ සිට නව නිර්දේශය අනුව සෙමෙස්තර ක්‍රමයට දේශන පවත්වා විභාග පැවැත්වේ. නමුත් එවකට පැවති අධිආරක්ෂක කලාපය ලෙසට නම් කර තිබූ හෙයින් නියමිත පරිදි පැය 2 1/2 ක දේශනය පැය 01 කට සීමා විය. එහිදි අධ්‍යයන වර්ෂයක් තුල නිමා කිරිමට තිබූ දේශන පැවැත්වෙන පාඨමාලාවේ කාලය දිර්ඝ විය. එසේ හෙයින් එක් ලිත් වර්ෂයක් තුල ගණනය කරන පැය ප්‍රමාණය වැඩිවීමට හෝ අඩුවීමට පුළුවන. කෙසේ වෙතත් එක් විෂයකට වෙන් කර ඇති පැය ගණන 40 කි. ඒ අනුව අදාල දේශක වරු විසින් දේශන පවත්වා ඇත.	වර්තමානයේ රටේ පවතින සාමකාමී වාතාවරණය යටතේ ආයතනයේ සියළුම දේශකයන් තමන්ට අදාළ දේශන පැය ගණන නියමිත පරිදි ආවරණය කරනු ලැබේ. තවද පාඨමාලාවේ දේශන කාර්යක්‍ෂමව කිරිම සඳහා ආයතනයට ආධුනික කථිකාචාර්යවරයෙකු බඳවා ගැනිමට කටයුතු කර ඇත.
3.2.2. ඌන උපයෝජිත වත්කම්	2007 සැප්තැම්බර් හා 2008 පෙබරවාරි යන මාස වලදි රු. 330,155 කට මිලදි ගත් ඇඟිලි සලකුණු සටහන් කිරිමේ යන්ත්‍ර තුනෙන් දෙකක් අළුත් වැඩියා කළ නොහැකි තත්වයේ පැවති බැවින් 2008 වර්ෂයේ සිටම භාවිතයට ගෙන නොතිබුණි.	එම යන්ත්‍ර 02 භාවිතකර හානි සිදුකිරිම නිසා තවදුරටත් අළුත්වැඩියා කල නොහැකි තත්වයේ තිබූ බැවින් 295 වන ශාස්ත්‍රිය කමිටු රැස්වීමෙන් අනුමැතිය ලබා ඇති අතර පසුව ගිනුම් වලින් ඉවත් කිරිම 2011 වර්ෂයේදි සිදුකිරිමට කටයුතු කරගෙන යනු ලැබේ. (ඇමුණුම 04,05,06,07)	296 වන ශාස්ත්‍රිය කමිටුවේ අනුමැතිය යටතේ එම භාණ්ඩ 2012 වර්ෂයේ ගිනුම් වලින් ඉවත් කර ඇත.. (ජ'නල් අංක 11055, 11056,11057)

මූල්‍ය ප්‍රකාශන කෙරෙහි වන බලපෑම	විගණකාධිපති විසින් පෙන්වා දී ඇති කරුණු	විගණකාධිපති වෙත දැනටමත් ඉදිරිපත් කර ඇති අදහස්	2013 වන විට ගන්නා ලද ක්‍රියාමාර්ග වර්තමාන තත්වය හා සංවර්ධනය
3.2.3 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම	2003 ජූනි 02 දින දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී 12 හි 5 වන පරිච්ඡේදයේ 5.1.3 ඡේදයට අනුව සංයුක්ත සැලැස්ම වාර්ෂිකව සකස් කළ යුතු වුවද, 2009 වර්ෂයේ සිට සංයුක්ත සැලැස්මක් හෝ එම වර්ෂ සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එබැවින් ආයතනය විසින් ඒ ඒ වර්ෂයන් ළඟා කර ගැනීමට බලාපොරොත්තු වූ අභිමතාර්ථ හා ඉලක්ක මොනවාද යන වග හා එහි මූල්‍ය හා භෞතික ප්‍රගතිය පරීක්ෂා කළ නොහැකි විය.	මේ වන විට පිළියෙල කර ඇත.	මේ වන විට පිළියෙල කර ඇත.
3.2.4 අයවැය ලේඛනය	පීඊඩී 12 ට අනුව සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර එය පදනම් කර වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කළ යුතු වුවද, ආයතනය විසින් ඉහත සැළසුම් වලින් තොරව අයවැය ලේඛනය පිළියෙල කර තිබුණි.	ආයතනයේ සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම මේ වනවිට පිළියෙල කර ඇත.	ආයතනයේ සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම මේ වනවිට පිළියෙල කර ඇත.
4 පද්ධති හා පාලන	පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ. (අ) විභාග කටයුතු	නිසිපරිදි විභාග පැවැත්වීමට හා ප්‍රතිඵල නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.	වර්තමානයේ නියමිත කාල සටහන්වලට අනුකූලව නිසිපරිදි විභාග පැවැත්වීමට හා ප්‍රතිඵල නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.
	(ආ) ස්ථාවර වත්කම් ලේඛනගත කිරීම	ස්ථාවර වත්කම් ලේඛනය යවත්කාලීන කර ඇති අතර ඉදිරි වර්ෂයන්හිදී මේ සඳහා පරිගණක මෘදුකාංගයක් භාවිතා කිරීමට අපේක්ෂා කරනු ලැබේ.	ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර ඇත.